## පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය - 2016

----------------------------------------------------------------

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 23 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108 (2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂකවරයා වෙත 2017 අප්‍රේල් 20 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වැනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

ආයතනය විසින් ප්‍රදාන, ක්‍රමක්ෂය කිරීම සඳහා ගිණුම් ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණු අතර පසුගිය වර්ෂ කිහිපයකදී ආයතනයට ප්‍රදාන ලෙස ලැබී තිබුණු වටිනාකම රු.284,016 ක් වූ පොත්පත් භාණ්ඩ හා උපකරණ වත්කම් ලෙස ගිණුම්ගතකර ක්ෂය කර තිබුණද ඒ වෙනුවෙන් වූ අරමුදල් ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව තොග වටිනාකම රු.534,370 ක් වූ අතර එදිනට ගබඩා තොග සමීක්ෂණ වාර්තා අනුව තොග ශේෂය රු.420,520 ක් වුයෙන් වර්ෂය අවසානයේ තොග ඌනතා හා අතිරික්තතා හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පර්යේෂණ හා ප්‍රකාශන තොග වටිනාකම හා භෞතික තොග වටිනාකම අතර රු.113,272 ක ඌනතාවයක් නිරීක්ෂණය විය. මෙම වෙනසට හේතුන් හඳුනාගෙන අයවිය යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ පාඩුවක් ලෙස ලියාහැරිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු මත පොලිය රු.60,062 ක් ගණනය කර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ස්ථාවර තැන්පතුවල වටිනාකම හා පොලී ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනයට අනුව මුළු වත්කම්වල වටිනාකම රු.36,040,387 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම වටිනාකම රු.39,700,003 ක් වුයෙන් මුළු ස්ථාවර වත්කම්වල රු.3,659,616 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව 2016 වර්ෂයේ දී මිලදී ගත් පොත් සහ වාර සඟරා වටිනාකම රු.1,118,489 ක් වුවත් පුස්තකාලය විසින් ලබා දුන් තොරතුරු අනුව එය රු.1,265,973 ක් විය. ඒ අනුව රු.147,484 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ ඌනතාවය රු.1,985,332 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.6,971,036 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.4,985,704 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ වියදම රු.22,997,327 කින් වැඩිවී තිබුණද රජයේ ප්‍රදාන රු.11,400,000 කින් හා වෙනත් ආදායම් රු.5,771,331 කින් වැඩි වීම ඉහත ඌනතාවය අඩුවීම කෙරේ ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

ඉකුත් වර්ෂ 05 ක මෙහෙයුම් ප්‍රතිඵලය සලකා බැලීමේදී අඛණ්ඩ ඌනතාවයක් පැවතියද සේවක පාරිශ්‍රමික හා අනෙකුත් ගැලපීම් කිරීමෙන් පසු එකතු කළ අගය වර්ධනය වීමේ ප්‍රවනතාවයක් නිරීක්ෂණය වේ. 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ දී රජයේ ප්‍රදාන රු. මිලියන 11 කින් වැඩි වීම හේතු කොට ගෙන ඌනතාවය සියයට 71 කින් අඩු වී තිබුණද එයට සාපේක්ෂව එකතු කළ අගය සියයට 51 කින් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

---------------

ශිෂ්‍යයන් ඇතුළත් කර පාලි බෞද්ධ විෂය ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධි තත්ත්වයේ ඉගැන්වීම, පුහුණු වීම හා පර්යේෂණ කිරීම සඳහා කටයුතු සැලැස්වීම පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා නිශ්චය කිරීම හා ප්‍රදානය කිරීමට සුදුසුකම් ලැබූ තැනැත්තන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම සහ තනතුරු ඇති කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණු විය.

ආයතනයේ මෙම අරමුණු ඉටුවීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

#### (අ) අධ්‍යයන කාර්යසාධනය

-----------------

ආයතනයේ 2016 වර්ෂයේ උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 527 ක් වූ අතර එයින් 464 ක් විභාග සඳහා පෙනී සිට තිබුණි. පසුගිය වර්ෂයේ සිසුන් 443 ක් ලියාපදිංචි වී සිටි අතර 390 ක් විභාග සඳහා පෙනී සිට තිබුණි. පසුගිය වර්ෂයේ විභාග සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 314 හෙවත් සියයට 80 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ විභාග සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 419 ක් හෙවත් සියයට 79 ක් විය.

#### (ආ) පර්යේෂණ ආධාර

------------

විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් විසින් සිදු කරනු ලබන පර්යේෂණ ප්‍රකාශයට පත් කිරීම මඟින් විශ්වවිද්‍යාලය ඉහළ මට්ටමකට හා ගුණාත්මක තත්ත්වයට ගෙන ඒමත් එම පර්යේෂණ නිබන්ධන ආර්ථික සංවර්ධනය උදෙසා ඉවහල් කර ගැනීමත් ජාතියක් වශයෙන් වැදගත්වනු ඇත.

ඒ සඳහා පර්යේෂණ ආධාර වශයෙන් සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් රු.1,000,000 ක් ලබාදී තිබුණි. පර්යේෂණ දීමනා ලබන නිලධාරින් දස දෙනෙකු ආයතනයේ සිටියදී එක් ආචාර්යවරයෙකුට පමණක් ඇස්තමේන්තුගත පිරිවැය රු.380,000 ක් වූ පර්යේෂණ

ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා 2016 වර්ෂය තුළදී රු.200,000 ක් ගෙවා තිබුණි. මේ අනුව පර්යේෂණ ව්‍යාපෘති සඳහා ලැබී තිබුණු මුදලින් උපයෝජනය කර තිබුණේ සියයට 20 ක් බැවින් පර්යේෂණ සඳහා යොමුවීමේ අඩුවීමක් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) **ප්‍රාග්ධන ආධාර**

**------------------**

අධ්‍යයන ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය ලබා දීම, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා විශ්වවිද්‍යාල පිහිටුවා ඇති අතර එහි කටයුතු ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම උදෙසා රජය මඟින් ප්‍රතිපාදන ලබා දී තිබුණි. එහෙත් ඉකුත් වර්ෂවල ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානවලින් වර්ෂය ආරම්භය වන විට රු. 502,938 ක් උපයෝජනය කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ලද රු. 6,202,115 කින් වැය කර තිබුණේ රු.2,920,832 ක් පමණක් වූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 48 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය රු. 3,784,221 ක් විය. මෙම ප්‍රදාන මුදල කාර්යාල, ඉගැන්වීම් උපකරණ හා පුස්තකාල පොත් අත්පත් කර ගැනීම සඳහා ලබා දී තිබුණු නමුත් එම මුදල් ඒ සඳහා නොයෙදවීම ආයතනයේ කාර්යසාධනය කෙරෙහි බලපාන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) **උපයන ලද ආදායම් උපයෝජනය කිරීම**

---------------------------------------------

පශ්චාත් උපාධි ආයතනය විසින් උපයන ලද මුළු ආදායමෙන් ආයුර්වේද පාඨමාලාව සඳහා වෙන්කරන ලද මුදලින් රු.137,452 ක් පසුගිය වර්ෂ 04 තුලම උපයෝජනය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී ද රු.67,000 ක් වෙන්කර තිබුණු අතර වර්ෂය අවසානයට එහි රු.204,452 ක ශේෂයක් පැවතුණි. එසේම 2015 හා 2016 වර්ෂයන්හි දිගුකාලීන පාඨමාලා සඳහා එකතු කළ රු.3,488,586 ක ආදායමින් වැයකළ ප්‍රමාණය රු.878,624 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එහි රු.2,609,962 ක ශේෂයක් ඉතිරි වී පැවතුණි. මෙම මුදල් ආයතනයේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) **පුස්තකාල පරිපාලනය**

**-------------------------**

පුස්තකාල පරිග්‍රහණ ලේඛනයේ ඇතුළත් කර ඇති නමුත් අස්ථානගත වී ඇති පොත් 693 කින් වටිනාකම රු.30,725 ක් වූ පොත් 156 ක් 1977 වසරේ සිට 2012 වසර දක්වා කාලයට අයත් බව නිරීක්ෂණය විය.

(ඊ) මෙම ආයතනය ආරම්භයේ සිට වසර 38 ක කාලයක් කුලී ගොඩනැගිලිවල පවත්වාගෙන ගොස් තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි කුලී වශයෙන් මාසයකට රු.764,583 ක් බැගින් සමාලෝචිත වර්ෂයට රු.9,174,996 ක් ගෙවා තිබුණි. ආයතනය සඳහා ඉඩමක් මිලදී ගෙන ගොඩනැගිල්ලක් ඉදිකිරීම ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන කාර්යයක් ලෙස දක්වා ඒ සඳහා රු.500,000,000 ක් ද වෙන් කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ඒ සඳහා ප්‍රතිපාදන ලබා දී නොතිබුණු අතර විගණිත දිනය වූ 2017 මාර්තු 31 දක්වා ද මෙම කාර්යය ඉටුකරගෙන නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ බැංකු සැසඳුම් පරීක්ෂා කිරීමේදී මාස 06 ක කාලයක් ඉක්මවූ රු.109,389 ක හඳුනානොගත් ආදායම් නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

ආයතනය විසින් 2016 වර්ෂයේ දී ශිෂ්‍ය කාර්යසාධනය යටතේ ළඟා කර ගැනීමට අපේක්ෂිත කාර්යයන් 16 ක් දක්වා තිබුණු අතර එයින් කාර්යයන් 04 ඉටු කර නොතිබුණි.

එසේම නව පාඨමාලා දෙකක් හඳුන්වා දීමට සැලසුම් කර තිබුණද 2016 වර්ෂයේ දී ආයතනය විසින් නව පාඨමාලා කිසිවක් හඳුන්වා දී නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ පුරෝකථනය කළ ආදායම හා සත්‍ය ආදායම සලකා බැලීමේදී ආදායම් රු.14,967,643 කින් වැඩි වී තිබූ අතර ඒ සඳහා දේශන ගාස්තු හා පාඨමාලා ආදායම් වැඩි වීම බලපා තිබුණි. එසේම 2016 හා 2015 වර්ෂවල අයවැය ගත වියදම් හා සත්‍ය වියදම් පරීක්ෂාවේදී මෙහෙයුම් වියදම් වැඩියෙන් පුරෝකථනය කර තිබුණු බව නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ගබඩා පාලනය | - | තොග ඌනතා හා අතිරික්තතා ගලපා ගිණුම් නිවැරදි කර නොතිබීම. |
| (ආ) | අයවැය පාලනය | - | අවශ්‍යතාවය ඉක්මවා වියදම් පුරෝකථනය කිරීම. |
| (ඇ) | පුස්තකාල පාලනය | - | පුස්තකාල පොත් ආපසු භාර දීම, පොත් සමීක්ෂණය, පොත් ලේඛනගත කිරීම, පොත් අස්ථානගත වීම. |